# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1986 අංක 43 දරන
## රක්ෂණ සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 දෙසැම්බර් මස 02 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 43 දරන රක්ෂණ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 දෙසැම්බර් මස 02 වන දින.]

එල්. ඩී. —ඕ. 6/85

**1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1986 අංක 43 දරන රක්ෂණ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1961 අංක 2 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ 6 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම (අඅ) වශයෙන් බල පැවැත්වෙන පරිදි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "(අඅ) අවශ්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පාලිත සමාගම් යම් සංඛ්‍යාවක්, 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කිරීමට.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

'අලුත් රක්ෂණ ව්‍යාපාර කටයුතු කිරීමට රක්ෂකයන්ට බලය දී ඇති බව.

> 10. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද සංස්ථාව හෝ අනු සංස්ථාවක්, ස්වාධීන සංස්ථාවක් හෝ රක්ෂණ ව්‍යාපාර කටයුතු කිරීමට බලය පවරනු ලැබ ඇති ලෙස 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති යම් සමාගමක් නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව ඇතුළත කවර වූ හෝ යම් පංතියක රක්ෂණ ව්‍යාපාර කටයුතු කරනු නොලැබිය යුතු ය:
>
> එසේ වුවද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් යම් ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මේ පනතේ විධිවිධාන සියල්ලෙන්ම හෝ ඉන් කිසිවකින් හෝ නිදහස් කරනු ලැබිය හැකි ය.

2—ඒ 092831—7,250 (86/09)

(2) මේ වගන්තියේ "ව්‍යවසාය" යන යෙදුමට, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.